# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1943/16 - 2015 දෙසැම්බර් මස 04 වැනි සිකුරාදා - 2015.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 981 දරන සුරාබදු නිවේදනය

**ධාන්‍ය මත්පැන් සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, 2015 දෙසැම්බර් මස 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි —

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහකට (5%) වඩා අඩු වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකටම රුපියල් එකසිය අනූවක් (රු. 190.00) වන බද්දක් පැන විය යුතු යැයි ද,

(2) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහක් (5%) සහ ඊට වැඩි වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකටම රුපියල් තුන්සිය පහළොවක් (රු. 315.00) වන බද්දක් පැනවිය යුතු යැයි ද,

(3) යම් විදේශීය රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින යම් තානාපති දූත මණ්ඩලයකට ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද ඒ මත්පැන් වර්ගයෙහි යම් ප්‍රමාණයක් සඳහා කළ යුතු ගෙවීම් ඒ තානාපති දූත මණ්ඩලයේ විදේශීය ගිණුම්වලින් කරනු ලැබේ නම් ඒ මත්පැන් ප්‍රමාණය වෙනුවෙන් ඉහත කී බද්ද අය නොකළ යුතු යැයි ද,

(4) 2015 නොවැම්බර් මස 20 වැනි දින අංක 1941/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 980 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

12 - 799

1A - PG 2718 — 506 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*